ුජිස්ට්‍රාර්/අධ්‍යක්ෂ ජනරාල්:
ාණිப்பாளர் நாயகம்/பதிவாளர் } 0112864483
rector Genaral/Registrar

ධ්‍යක්ෂ
ාණිப்பாளர் } 011-2888424
rector

කාර අධ්‍යක්ෂ
உதவி பணிப்பாளர் } 011- 884612
sst. Director

ාර්යාලය
லுவலகம் } 011 -2877376
ffice

ෆැක්ස් :
தொலை நகல் } 011-2864483
x



මගේ අංකය
எனதுஇல.
My No. } VSSO/NGO/MON/CIRCULA/01

ඔබේ අංකය
உமதுஇல.
Your No. }

දිනය
திகதி
Date } 22.12.2022


# මහජන ආරක්ෂක අමාත්‍යාංශය
# பொதுமக்கள் பாதுகாப்பு அமைச்சு
# Ministry of Public Security


**රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය-15 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.**
அரச சார்பற்ற நிறுவனங்களின் தேசிய செயலகம் - 15ஆம் மாடி, சுஹுருபாய, பத்தரமுல்ல.
**National Secretariat for Non-governmental Organizations - 15th Floor, Suhurupaya, Battaramulla.**
විද්‍යුත් තැපැල්/மின் அஞ்சல்E-mail:ngosecretariat.gov@gmail.com


සියළුම දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම්වරු වෙත,
සියළුම දිස්ත්‍රික් රාජ්‍ය නොවන සම්බන්ධීකාරකවරු වෙත,

**<u>ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන / රාජ්‍ය නොවන සංවිධාන අධීක්ෂණය සහ සුපරීක්ෂණය</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා විසින් 2022.12.22 දිනැතිව නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 08 සම්බන්ධයෙනි.

02. උක්ත සඳහන් චක්‍රලේඛයෙහි ඡේද අංක 04 හි සඳහන් පරිදි රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වී ඇති ජාතික මට්ටමේ සියළුම ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන සිය සංවිධානයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය. ප්‍රධාන කාර්යාලය මගින් එම සංවිධානවල වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් අධීක්ෂණය සිදුකිරීම සඳහා අදාල දිස්ත්‍රික් රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකාරක නිලධාරී වෙත යොමු කරනු ලැබේ.

03. චක්‍රලේඛයෙහි ඡේද අංක 05හි සඳහන් කර ඇති පරිදි රාජ්‍ය නොවන සංවිධාන විසින් සිය සංවිධානයේ කාර්තුමය ප්‍රගති වාර්තා (අනුමත ආකෘතියට අනුව සකස් කරන ලද) ප්‍රධාන කාර්යාලයට ද පිටපතක් සහිතව අදාල දිස්ත්‍රික් රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකාරක වෙත නියමිත ආකෘතියේ දක්වා ඇති දින හෝ ඊට පෙර යොමු කළ යුතුය.

04. සිංහල, දමිළ හා ඉංග්‍රීසි භාෂාවෙන් අදාල චක්‍රලේඛය මෙම ලිපිය සමඟ අමුණා ඇත.

05. චක්‍රලේඛයෙහි ඡේද අංක 08 හි සිංහල, දමිළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය අගය කරමි.

සංජීව විමලගුණරත්න
අධ්‍යක්ෂ ජනරාල් /රෙජිස්ට්‍රාර්

ணிப்பாளர் நாயகம்/பதிவாளர் } 0112864483
rector Genaral/Registrar

ධ්‍යක්ෂ
ணிப்பாளர் } 011-2888424
rector

හකාර අධ්‍යක්ෂ
உதவி பணிப்பாளர் } 011- 884612
sst. Director

ර්යාලය
லுவலகம் } 011 -2877376
ffice

ක්ස් :
ொலை நகல } 011-2884612
x

එනතුඉල.
My No. } VSSO/NGO/MON/CIRCULA/01

ඔබේඅංකය
உமதுஇல.
Your No. }

දිනය
திகதி
Date } 22.12.2022

**මහජන ආරක්ෂක අමාත්‍යාංශය**
**பொதுமக்கள் பாதுகாப்பு அமைச்சு**
**Ministry of Public Security**

**රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය-15 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.**
அரச சார்பற்ற நிறுவனங்களின் தேசிய செயலகம் - 15ஆம் மாடி, சுஹுருபாய, பத்தரமுல்ல.
**National Secretariat for Non-governmental Organizations - 15th Floor, Suhurupaya, Battaramulla.**
විද්‍යුත් තැපැල්/மின் அஞ்சல்E-mail:ngosecretariat.gov@gmail.com

චක්‍රලේඛ අංක :08

සියළුම දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම්වරු වෙත,
සියළුම දිස්ත්‍රික් රාජ්‍ය නොවන සම්බන්ධීකාරකවරු වෙත,

<u>ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන / රාජ්‍ය නොවන සංවිධාන අධීක්ෂණය සහ සුපරීක්ෂණය</u>

01). ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) සඳහා වන 1980 අංක 31 දරණ පනතෙහි 2.(2) ප්‍රතිපාදන ප්‍රකාරව සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / ප්‍රාදේශීය ලේකම්වරුන් නියෝජ්‍ය / සහකාර රෙජිස්ට්‍රාර්වරුන් ලෙස පත්කර ඇත.

02). උක්ත පනතෙහි 2.(4) ප්‍රකාරව නියෝජ්‍ය / සහකාර රෙජිස්ට්‍රාර්වරුන් වෙත තම බල සීමාව ඇතුළත ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධයෙන් ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා බලය පැවරී ඇත.

03). ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන / රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීම ජාතික මට්ටම, දිස්ත්‍රික් මට්ටම සහ ප්‍රාදේශීය මට්ටම වශයෙන් ස්ථර 3ක් යටතේ ක්‍රියාත්මක වන බැවින් එසේ ලියාපදිංචි වූ සංවිධාන අදාල බලය පවරන ලද නිලධාරියා වෙත සිය සංවිධානයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රගති වාර්තා යොමු කළ යුතුය.

04) රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වී ඇති ජාතික මට්ටමේ සියළුම ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන සිය සංවිධානයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය. ප්‍රධාන කාර්යාලය මගින් එම සංවිධානවල වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් අධීක්ෂණය සිදුකිරීම සඳහා අදාල දිස්ත්‍රික් රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකාරක නිලධාරී වෙත යොමු කරනු ලැබේ.

05) රාජ්‍ය නොවන සංවිධාන විසින් සිය සංවිධානයේ කාර්තුමය ප්‍රගති වාර්තා (අනුමත ආකෘතියට අනුව සකස් කරන ලද) ප්‍රධාන කාර්යාලයට ද පිටපතක් සහිතව අදාල දිස්ත්‍රික් රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකාරක වෙත නියමිත ආකෘතියේ දක්වා ඇති දින හෝ ඊට පෙර යොමු කළ යුතුය.

රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකාරක විසින් දිස්ත්‍රික් මට්ටමේ ප්‍රගතිය පරීක්ෂා කිරීමෙන් අනතුරුව අදාල දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශය සහිතව රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය වෙත යොමුකළ යුතුය.

තවද, දිස්ත්‍රික් මට්ටමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීමේදී එම සංවිධානයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන හවුල්කාර සංවිධාන තිබේ නම්, එම සංවිධාන දිස්ත්‍රික් සම්බන්ධීකාරක හරහා ප්‍රධාන කාර්යාලය වෙත ප්‍රගති වාර්තා ඉදිරිපත්කළ යුතුය. (සියළුම හවුල්කාර සංවිධාන 1980 අංක 31 දරණ ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන ලියාපදිංචි කිරීමේ පනත යටතේ ලියාපදිංචි වූ ආයතන විය යුතුය )

06) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වී ඇති සියළුම ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන සිය සංවිධානයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රගති වාර්තා නියමිත ආකෘති පත්‍රවල දක්වා ඇති දින හෝ ඊට පෙර දිස්ත්‍රික් රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකාරකාරක වෙත යොමු කළ යුතුය.

07) ප්‍රාදේශීය වශයෙන් ලියාපදිංචි වී ඇති සියළුම ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන සිය සංවිධානයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රගති වාර්තා අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යොමු කල යුතුය.

සංජීව විමලගුණරත්න
අධ්‍යක්ෂ ජනරාල් /රෙජිස්ට්‍රාර්

පිටපත : සියළුම ලියාපදිංචි රාජ්‍ය නොවන සංවිධාන - කරු .දැ. ගැ. ස. සහ අ.කා.ස